**පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය - 2022**
---------------------------------------------

පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2015 ඔක්තෝබර් 23 දින එළඹි අංක 5678 දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 2හි II කොටසේ ඇ(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

මූල්‍ය ගිවිසුමට අනුව, කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර එහි කටයුතු වැවිලි මානව සංවර්ධන භාරය හරහා ක්‍රියාත්මක කරනු ලැබේ. මුල් ළමාවිය සංවර්ධන සේවාවන්හි සාධාරණ ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මුල් ළමාවිය සංවර්ධන සේවා සැපයීම පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය, අධීක්ෂණය සහ ඇගයීම යනාදි සංරචක 2ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. මූල්‍ය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 7,250කට සමාන එ.ජ.ඩො. මිලියන 50ක් වූ අතර සම්පූර්ණ මුදල ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 මාර්තු 01 දින ආරම්භ කර තිබුණු අතර 2021 ජූනි 30 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2022 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර නැවත 2023 ජූනි 15 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2.1 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(5) | අතුරු අත්තිකාරමක් නිකුත් කරන විට වියදම් නොකළ මුදල, අත්තිකාරම නිකුත් කළ මූල්‍ය වර්ෂයේ දෙසැම්බර් 31 හෝ ඊට පෙර පියවිය යුතුය. කෙසේවෙතත්, 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ හිඟ අත්තිකාරම් ශේෂය රු. මිලියන 28.6ක් පැවතුණි. | නොපියවූ අත්තිකාරම් රු. මිලියන 28.6න් රු.මිලියන 28.3ක් මෙම ව්‍යාපෘතිය සහ ජාතික ළමා ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පුහුණු වැඩසටහන් සහ අනෙකුත් කාර්යයන් සඳහා නිකුත් කරන ලද අත්තිකාරම් වලින් සමන්විත වේ. | මූල්‍ය රෙගුලාසි අනුගමනය කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| මානව සම්පත් භාරය විසින් රු. මිලියන 214 ක මුදලකට ප්‍රදානය කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති 19ක ඉදිකිරීම් කටයුතු 2022 දෙසැම්බර් 31 වන විට ඇවර කර තිබුණු අතර එම ව්‍යාපෘති සඳහා මූල්‍ය වර්ෂය අවසන් වනවිට රු. මිලියන 37 ක මුදලක් ගෙවා තිබුණි. මෙම ඇවර කරන ලද ව්‍යාපෘති 19, 2023 මාර්තු සහ අප්‍රේල් මාසවලදී රු. මිලියන 330කට නැවත ප්‍රදානය කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතාවය හේතුවෙන් මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියට රු. මිලියන 153ක පාඩුවක් සිදුව ඇති බව නිරීක්ෂණය විය. | (ආ) ඡේදයේ සඳහන් පරිදි පාඩුව සිදුවූයේ කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා නිසා නොව රටෙහි පැවති පාලනය කළ නොහැකි තත්ත්වය නිසා වේ. එම තත්ත්වය ව්‍යාපෘතිය මඟින් පාලනය කළ නොහැකි බැවින් ලෝක බැංකුවේ අනුදැනුම ඇතිව කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා විසින් ඉතිරි වැඩ සඳහා නැවත ලංසු කැඳවා අවසන් කිරීමට අනුමැතිය ලබා දෙන ලදි. | අමතර වියදම් අවම කිරීම සඳහා නිසිපරිදි කොන්ත්‍රාත් පරිපාලනය සිදුකළ යුතුය. |

### 3.2 සම්පත් උපයෝජනය

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | ව්‍යාපෘති සංවර්ධන වියදම් ලෙස රු. මිලියන 135ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට එම මුදල් අදාළ කටයුතු සඳහා උපයෝජනය කිරීමකින් තොරව මුදල් හා මුදල් සමාන ශේෂයක් ලෙස නිශ්කාර්යව පැවතුණි. | උදෑසන ආහාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ලෝක බැංකුවේ අනුමැතිය ප්‍රමාද වීම සහ අනපේක්ෂිත ලෙස ඉදිකිරීම් 19 නතර කිරීම හේතුවෙන් මෙම ශේෂය පැවතුණි. (රු. 134,910,632/-) කෙසේවෙතත්, එය 2023 ජනවාරි මාසය තුළ වියදම් කර ඇත. (ඇමුණුම 1) දිගු කලක් තිස්සේ මුදල් රඳවා තබා ගැනීමක් නොමැත. | අත ඇති මුදල් පිළිබඳ මූල්‍ය පාලනය ශක්තිමත් කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනවලට අනුව ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 2ක් ලැබී තිබුණි. කෙසේවෙතත්, එය හඳුනාගෙන නොතිබුණි. | ව්‍යාපෘතියට තැන්පතුකරුවන් හඳුනා ගැනීම සඳහා නිතිපතා බැංකුව හා සම්බන්ධ වීමට සිදුවන අතර සමහර ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා කරන ලද තැන්පතු හඳුනා ගැනීමට බැංකුවද අසමත් වේ. මේ නිසා හඳුනා නොගත් ලැබීම් නිරන්තරයෙන් බැංකු ගිණුම්වල දක්නට ලැබෙන අතර ඉහත හේතුන් මත ඒවා හඳුනා ගැනීමට කාලය ගතවේ. | සෘජු තැන්පතු පිළිබඳ මූල්‍ය පාලනය ශක්තිමත් කළ යුතුය. |